රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 318

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1985 දෙසැම්බර් මස 17 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

විදේශයන්හි අධ්‍යයන කටයුතු/රැකියාවන් සඳහා
රාජ්‍ය නිලධාරීන්ට වැටුප් රහිත නිවාඩු දීම -
නව ආයතන සංග්‍රහය - XII වැනි පරිච්ඡේදය

16:1 වන උප වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන පරිදි ආදේශ කළ මැනවි.

"16:1:1 - ස්ථිර කරනු ලැබූ රාජ්‍ය නිලධරයෙකුට, අධ්‍යයන හෝ විදේශ රැකියා සඳහා නැතහොත් ඒ දෙකම සඳහා (එනම්, අධ්‍යයනයෙන් අනතුරුව රැකියාවක් හෝ එහි ප්‍රතිලෝම වශයෙන් හෝ) සිය සේවා කාලය තුල මුළු ගණනින් පස් වසරක කාලසීමාවක් සඳහා වැටුප් රහිත නිවාඩු දිය හැකිවේ. ස්ථිර කරනු නොලැබූ හෝ තාවකාලික වූ නිලධරයෙකුට මෙම අනුග්‍රහය දිය හැකි වනුයේ අධ්‍යයනය සඳහා පමණකි.

16:1:2 - අධ්‍යයනය සඳහා දෙනු ලබන අඛණ්ඩ කාලපරිච්ඡේදය අවුරුදු තුනක් නොඉක්මවිය යුතු අතර, රැකියාවක් සඳහා පමණක්, අඛණ්ඩ කාලපරිච්ඡේදය අවුරුදු පහ දක්වා විය හැක."

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.